# 10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදාහැරීම



අන්තර්ගතය - A.M.R.N.S අමරතුංග- ගුරු උපදේශක - රත්නපුර අධ්‍යාපන කලාපය
සැකසුම - K.A.අමරසේන- බප/ජය /හින්දු විද්‍යාලය , කොළඹ

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක බලය**

ලෙස සලකා ලබන්නේ පාලන කටයුතු පවත්වාගෙන යෑම සඳහා ඇති හැකියාවයි.

- ❖බලයේ අවසාන හිමිකරුවා ජනතාවයි.
- ❖ජනතාව සතු එම බලය පරමාධිපත්‍ය බලය ලෙස සලකයි.



ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 4 වන වගන්තියේ පරමාධිපත්‍යය බලය ක්‍රියාත්මක වන හැටි විස්තර කරයි.

**1978 ව්‍යවස්ථාවේ 4 වන වගන්තියට අනුව**

- ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරාගත් හා පාර්ලිමේන්තුව හා ජනමත විචාරනයකදී ජනතාව විසින්ද ක්‍රියාත්මක කරයි.
- රටේ ආරක්ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරාගන්නා ලද ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කරයි.
- ජනතාවගේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලැබූ අධිකරණ හෝ විනිශ්චය සභා මඟින් ක්‍රියාත්මක කරයි.

# බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදාහැරීම

## බලය

### විමධ්‍යගත කිරීම

1.පරිපාලන බලය පමණක් පවරා දෙයි.

2.ව්‍යවස්ථාදායක මඟින් පවත්වනු ලබන පනත් මඟින් සිදුකරයි.

3.නැවත පවරා ගැනීමේ හැකියාව ඇත.

@උදා:-අමාත්‍යාංශ ලේකම් → දිස්ත්‍රික් ලේකම් → ප්‍රාදේශීය ලේකම් → සාම නිලධාරි

මහ නගර සභා → නගර සභා → ප්‍රාදේශීය සභා

### බෙදාහැරීම .

1.මධ්‍යම රජය සතු ව්‍යවස්ථාදායක ,විධායක හා අධිකරණ බලයෙන් කැමති ප්‍රාදේශීය පාලන ඒකක වලට පවරා දීමටයි.

2.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පමණක් බෙදා දීමේ හැකියාව.

3.නැවත පවරා ගැනීමත්/නිදහස් කිරීමත් සිදුකරන්නේ නම් ව්‍යවස්ථා සංශෝධනයකින් පමණක් සිදු කළ හැකි වේ.

4.විවිධත්වය තුළින් එක්සත් කම ගොඩනගා ගැනීම.

5.බහු වාර්ගික ජනතාව ඇති විටෙක සිදුකරයි.

උදා:-පළාත් සභා ක්‍රමය .

ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 13 වන සංශෝධනය මඟින් සිදු කර ඇත.

